# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 2484500, 011 2484600, 011 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: MF1/01/05/02/2020-අභ.ස්.මා.
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019.08.23

මුදල් අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්/
අමාත්‍යාංශයේ කාර්යාලවල සියලුම අංශ ප්‍රධානීන් වෙත,

අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආනයන හා අපනයන පාලක ජනරාල්
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි,

**ඒකාබද්ධ සේවයේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම් - 2020**
**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය/ රියදුරු සේවය/ කාර්යාල සේවක සේවය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර සේවය/ සංවර්ධන නිලධාරි සේවය**

ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2020 සම්බන්ධයෙන් වූ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019.06.27 දිනැති අංක COMS/Trans/වා.ස්.මා./2020 දරණ 03/2019 චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුව, අමාත්‍යාංශයේ අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය විසින් ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම අනුමතකර තිබේ. එම ස්ථාන මාරු උපලේඛන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පලකර ඇති බව කාරුණිකව දන්වමි.

02. මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධව අභියාචනා වෙතොත්, රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01)හි අංක 14 පරිශිෂ්ටයේ දක්වා ඇති ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අභියාචනා 2019.08.30 දිනට පෙර මා වෙත එවීමට කටයුතු කළ යුතු අතර එදිනට පසුව ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් සලකාබැලීමට නොහැකි බව සියලුම නිලධාරීන් වෙත දැනුම් දීමට ද කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වමි. (එම ආකෘතියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

මෙයට විශ්වාසී,

ඩී.එච්.එස්. පුල්ලපෙරුම
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

පිටපත : ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

<u>මුදල් අමාත්‍යාංශය</u>

<u>අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩල තීරණයට එරෙහි අභියාචනා අයදුම්පත</u>

..........................................
.......................................
......................................
2019.

.......................................................... මගින්,

............................................................

<u>යෝජිත වාර්ෂික ස්ථාන මාරුව සම්බන්ධයෙන් කරුණු දැක්වීම</u>

මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පලකරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය/ කාර්යාල සේවක සේවය/ රියදුරු සේවය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර සේවය/ සංවර්ධන නිලධාරි සේවය සඳහා අදාල අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩල තීරණයේ අංක ..................... ට අදාලව ................................................ දෙපාර්තමේන්තුවට මා හට ස්ථාන මාරු ලබාදී ඇත. / ලබා දී නැත.

02. පහතින් විස්තර කරනු ලබන කරුණු මත එම යෝජිත ස්ථාන මාරුව අවලංගු කරන ලෙස/ සංශෝධනය කරන ලෙස/ නැවත සලකා බලන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

(1) ..................................................................................................................................

(2) ..................................................................................................................................

(3) ..................................................................................................................................

03. ඉහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා අදාල පහත සඳහන් ලියවිලි වල සහතික කළ ඡායා පිටපත් මේ සමඟ යා කර ඇත.

04. මාගේ අභ්‍යාන්තර ස්ථාන මාරුව පහත සඳහන් සේවා ස්ථානයකට ලබාදෙන ලෙස ද ඉල්ලමි.

පළමුවන මනාපය ..........................................................................................

දෙවන මනාපය ..........................................................................................

තුන්වන මනාපය ..........................................................................................

.................................................

අත්සන

**දෙපාර්තමේන්තු ප්‍රධානගේ නිර්දේශය**

................................................ විසින් ඉහතින් දක්වා ඇති කරුණු සත්‍ය බවට සෑහීමට පත්වෙමි/නොවෙමි. ඉල්ලීම ඉටුකිරීම නිර්දේශ කරමි/ නොකරමි.

අත්සන : .............................................

නම : .............................................

තනතුර : .............................................

නිල මුද්‍රාව : .........................................

දිනය : .....................................................